# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2020** | **11 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2020** | **தரம் 11**
**Third Term Test 2020** | **Grade 11**

| | | |
|---|---|---|
| නර්තනය (දේශීය) | II | කාලය පැය 2.00 |
| Dancing Oriyantal | II | Time 2.00 hours |
| நர்த்தனம் (தேசிய) | II | 2.00 மணித்தியாலம் |

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ**

---

01) සියලුම ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න

i. මිනිස් සිතෙහි පහලවන හැඟුම් ......................... ලෙස හඳුන්වයි
ii. ගිරාගම ගුරු විද්‍යාලය .................... වර්ෂයේ දී ආරම්භ විය
iii. අංග රචනයේදී ත්‍රිමාන බව මතු කිරීමට ................. නම් ශිල්ප ක්‍රමය අනුගමනය කරයි
iv. පරයා සහ ගුරුහාමි .................. නාටකයට අයත් චරිත වේ
v. දක්ෂිණ භාරතයේ ................ ප්‍රාන්තයේ කථකලි නර්තනය ප්‍රභවය ලැබිය
vi. සිසි, මණ්ණඩිරාල ................. මුද්‍රා නාට්‍යයේ චරිත වේ
vii. ද්‍රවිඩ ගැමි නැටුමක් වන කාවඩි නැටුම .................. දෙවියන්ට පූජෝපහාර ලෙස නර්තනය කරයි
viii. නන්දි කේශ්වර විසින් රචිත කෘතිය හඳුන්වනු ලබන්නේ ................. නමිනි
ix. මණිපුරි නර්තනයේ
(අ) ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ...............
(ආ) සංගීත සම්ප්‍රදාය .................
x. මිරැන්ඩා හේමලතා මහත්මිය විස්න් නිෂ්පාදනය කරන ලද නෘත්‍ය නාටක දෙකකි
I ......................
II ......................

(ලකුණු 12)

02) i. සැවුලා වන්නමට අයත් බෙර පදය ප්‍රස්තාර ගත කරන්න
ii. "රනේ රුවසෙ වත රුවින් දිලේදෝ .................." මෙම කවි පදය මාත්‍රා 3+3 තනි තිතට ප්‍රස්තාර ගත කරන්න
iii. මුසලඩි වන්නමේ අඩව්ව ප්‍රස්තාර ගත කරන්න

(ලකුණු 4x3=12)

03) පහත මාතෘකා අතරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න
1. ප්‍රශස්ති කවි
2. ද්‍රවිඩ ජන නැටුම්
3. තුන් තිතේ ප්‍රභේද
4. වාද්‍ය භාණ්ඩ හා සන්නිවේදනය
5. අංග රචනය

(ලකුණු 4x3=12)

04) i. නර්තන කලා ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර හතරක් නම් කරන්න

ii. නර්තන කලාවේ ප්‍රවර්ධනයට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට සාධක දෙකක් වංශ කතා ඇසුරින් ඉදිරිපත් කරන්න

iii. නූතන නර්තන ප්‍රවනතා හතරක් ලියන්න

(ලකුණු 4x3=12)

05) ශාන්තිකර්ම වල චාරිත්‍ර, නර්තන, සැරසිලි එකිනෙකට වෙනස් වේ

i. කොහොඹා කංකාරියේ එන පූර්ව චාරිත්‍ර හතරක් නම් කරන්න

ii. පහන් මඩුවේ සැරසිලි දෙකක් නම් කර යොදා ගන්නා අමුද්‍රව්‍ය ලියන්න

iii. ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මයේ වාද්‍ය භාණ්ඩයේ රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න

(ලකුණු 4x3=12)

06) දේශීය ජන නාටක අතර සොකරි හා කෝලම් විශේෂ වේ

i. කෝලම් නාටකය ප්‍රචලිත ප්‍රදේශ හතරක් ලියන්න

ii. සොකරි චරිතය පිළිබඳව විග්‍රහයක් කරන්න

iii. සොකරි හා කෝලම් නාටක වල දක්නට ලැබෙන වෙනස්කම් සාකච්ඡා කරන්න

(ලකුණු 4x3=12)

07) පහත රූප රාමු ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න



A



B



C

i. A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර රංග වස්ත්‍රාභරණ පිළිබඳ හැඳින්වීමක් කරන්න

ii. B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ නම් කර නර්තන අංග දෙකක් ලියන්න

iii. හින්දුස්තානි සංගීතය අන්තර්ගත නර්තන සම්ප්‍රදාය නම් කර ඊට අයත් නර්තන අංගයක් පිළිබඳ විස්තර කරන්න

(ලකුණු 4x3=12)